# හින්දී-සිංහල උපදේශාත්මක පිරුළුවලින් හෙළිවන භාරතීය සහ ලාංකේය සමාජාගමික සබඳතාව

*ප්‍රසන්ත, ඩී. ඩී. නලින්* [1]

ප්‍රස්තාව පිරුළු හෙවත් ආප්තෝපදේශ හින්දී භාෂාවෙන්, '**ලෝකෝක්ති**' යන නමින් හඳුන්වනු ලැබේ. ලෝකෝක්ති යන පදයෙහි වචනාර්ථය වනුයේ ජනයා අතර ප්‍රචලිත '**උක්තිය**' හෙවත් '**යෙදුම**' යන්නයි. '**කහාවත්**' හෙවත් කියමන යන පදය '**ලෝකෝක්ති**' යන පදයට සමාන අරුත් දේ. මෙම පදය පළමු වරට '**පංචතන්ත්‍රය**' වැනි ග්‍රන්ථවල භාවිත වනු දැකිය හැකිය. කාව්‍ය ශාස්ත්‍රයෙහිදී ලෝකෝක්තිය එක් අලංකාරයක් ලෙස භාවිත වී ඇත. මේ අනුව '**පංචතන්ත්‍රය**', '**කාව්‍ය ශාස්ත්‍රය**' වැනි ග්‍රන්ථවලද ලෝකෝක්තියට හිමි වූ ස්ථානය සලකා බැලීමේදී මෙය ඉතා වැදගත්, භාෂාව සමෘද්ධිමත් හා පරිපූර්ණත්වයට පත් කරන්නා වූ භාෂා අංගයක් ලෙස සැලකිය හැකිය. ඕනෑම භාෂාවක අර්ථෝද්දීපනය, අලංකාරය සඳහා මෙන්ම ව්‍යංග්‍යාර්ථ ප්‍රකාශ කිරීමටද යොදා ගැනෙනුයේ ප්‍රස්තාව පිරුළු හා රූඪීය. භාෂා ව්‍යවහාරයේදී මෙම භාෂාංගවලට වැදගත් ස්ථානයක් හිමි වේ. පිරුළු ගැන බොහෝ විද්වතුන් විවිධ මත ඉදිරිපත් කොට ඇති අතර භාරතීය හා ලාංකේය විද්වතුන්ගේ මත වනුයේ ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ වැකියක්ය යන්නයි. ලෝකෝක්තිවල ස්වරූපයෙහි කිසියම්ම වෙනසක් සිදු කළ නොහැකි වන අතර, ව්‍යාකරණ නීති-රීතීවල බලපෑමක් ඒ කෙරෙහි සිදු නොවේ. එබැවින් ලෝකෝක්ති භාවිතයේදී ලිංග භේද, කාල භේද, වචන භේද ආදිය මුල් කොටගෙන එහි සැකිල්ලෙහි කිසියම් වෙනසක් සිදු නොවේ. ව්‍යාකරණානුකූලව සම්පූර්ණ නොවූවද ඉදිරිපත් කිරීමේ ස්වරූපය අනුව ලෝකෝක්ති පරිපූර්ණ වැකියකි. එබැවින් මෙය භාවිතයෙහිදී කථනයක් හෙවත් පූර්ණ වැකියක් ලෙස යෙදෙයි. උදාහරණයක් ලෙස '**අධ්ජල් ගග්රී ඡල්කත් ජාය්**' යන පිරුළ ගත් කල මෙය සම්පූර්ණ වැකියක් වන අතර, '**අඩු කළේ දිය සෙලවේ**' යන අදහස උපදේශාත්මක ස්වරූපයකින් ප්‍රකාශ වේ. බොහෝ විට ලෝකෝක්තියක් වූ කලි උපදේශයකි. මෙම හින්දී, සිංහල පිරුළු අනුව භාෂා ද්වයයෙහිම සමානාර්ථයෙන් භාවිත වන අවස්ථා පැවතීම හේතුවෙන් ඉන් ගම්‍ය වන්නා වූ සමාජීය, සංස්කෘතික හා ආගමික සබැඳියාව මොනවට පැහැදිලි වේ.

**ප්‍රමුඛ පදඃ** ප්‍රස්තාව පිරුළු, ආගමික සබැඳියාව, සමානතාව

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල හා නූතන භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.* nalinprashantha91@gmail.com